සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade 11	විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper II	පැය / மணித்தியாலம் / Hours 02

සැලකිය යුතුයි:

♦ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

(01)අංක(i)සිට (x) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i)සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් වන පහත අක්ෂර කාණ්ඩ දෙක ව්‍යඤ්ජන වර්ගීකරණය අනුව නම් කරන්න.

අ) ඟ , ජ , ඞ , ඳ , ඹ (ආ) බ , ඡ , ඨ , ඪ , ඵ

(ii)පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය.එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

විශ්වයේ ප්‍රභවය පිළිබඳව ඇතැමුන් ඉදිරිපත් කළ ප්‍රහන්ධ ප්‍රතික්ෂේප වූ නිසා ඔවුන්ගේ ප්‍රයත්න නිෂ්පල වූ බවට ප්‍රවෘත්ති පළ විය.

(අ) .... (ආ) ....

(iii) පහත සඳහන් වාක්‍යයේ නාම විශේෂණ පදය හා ක්‍රියා විශේෂණ පදය පිළිවෙළින් ලියන්න.

♦ දක්ෂ දරුවෝ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වෙති.

(අ) .... (ආ) ....

(iv) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) නිල් + උපුල් (ආ) මිණි + අබරණ

(v) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්,ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ශිෂ්‍යයෝ විවාද තරගයෙන් ජය ගනිති'යි ගුරුවරු සිතුහ.

(ආ) ආරෝග්‍යශාලාවට රෝගීහු පැමිණෙනු ඇත.

(vi) පහත සඳහන් වචනවල අනුක්ත රූප ලියන්න.

(අ) පුරාවිද්‍යාඥයෝ (ආ) ළමයෙක්

(vii) "අතිදක්ෂ ලෙස ධර්මය දෙසූ අනුනාහිමියන්ට දායකයෝ දහම් පඬුරු පූජා කළහ." යන වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.

(අ) ....(ආ) ....

(viii) දරුවාගේ,ගසෙන් යන පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කර ලියන්න.

(අ) දරුවාගේ (ආ) ගසින්

(ix) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය, කර්තෘකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

(අ) දරුවන් විසින් දෙමාපියෝ නමදිනු ලබති.

(ආ) ගායකයන් විසින් රසිකයෝ සතුටට පත් කරන ලදහ.

(x) ඉරි ඇඳි පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

කෙටි කතාවක් නිර්මාණය කිරීම <u>ආකස්මික</u> ව කළ හැකි දෙයක් නොවේ.ඒ සඳහා <u>සතතාභ්‍යාසය</u> අවශ්‍ය ය.

(අ) .... (ආ) ....

(ල: 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක්ලියන්න.එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අකුර ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පත්‍රයේ ලියාරචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා සුදුසු **මාතෘකාවක් ද** යොදන්න.

(අ) ජංගම දුරකථන භාවිතය මේ වන විට බෙහෙවින් ව්‍යාප්ත වී ඇත.ගෝලීයකරණය සමඟ ඇති වී තිබෙන නව විපර්යාස හමුවේ සන්නිවේදන කාර්යය පහසු කිරීමේ ලා මෙවැනි නව තාක්ෂණික මෙවලම් මහෝපකාරී වේ.එහෙත් ඒවා තුළින් අසන්නට දකින්නට ලැබෙන දේවල් කිසිදු තහනමකින් හෝ සීමාවකින් තොරව ලබා ගැනීමට හැකි වීම ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.එබැවින් මෙවැනි විද්‍යුත් මෙවලම් අවිචාරයෙන් පරිහරණය කිරීමෙන් වැළකී මැනවින් තෝරා බේරා ක්‍රියාවට නැංවීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි වේ.

(ආ) කෘෂිකර්මාන්තය අප රටේ අතීතයේ සිට ම පවතින ප්‍රධාන ජීවන ක්‍රමයකි.එය නංවාලීම ජාතික අවශ්‍යතාවකි.එහෙත් අද වන විට කෘෂිභෝග නිෂ්පාදනයේ දී ගොවියාට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති බැවින් කෘෂි නිෂ්පාදන දිනෙන් දින පහතට වැටෙමින් පවතී.මේ නිසා වර්තමානයේ සිදු වී ඇත්තේ ආනයනය මගින් ආහාර අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමයි.එහෙයින් කෘෂිකර්මාන්තය දියුණු කර ගොවීන්ගේ ගැටලු අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සලසා ගොවීන් දිරි ගැන්විය යුතු කාලය එළඹී තිබේ.

(ඉ) වත්මන් සමාජයේ සිසු දරුවන් තුළ කියවීමේ රුචිය ක්‍රමයෙන් ගිලිහී යන බව අද සමස්ත සමාජයම පිළිගත් මතයකි.ඊට හේතුව කැසට්,වීඩියෝපට,රූපවාහිනිය ඔවුන්ට සමීප වීමයි.දැනුම වේගයෙන් වැඩෙන,පැතිරෙන වර්තමානයේ සෙසු රටවල් හා ඉදිරියට යෑමටත්,විවේකය විනෝදයෙන් හා ඵලදායි අන්දමින් ගත කිරීමටත් පොතපතින් ලැබෙන උපකාරය අතිවිශාල ය.පාසල් අවධියේ සිටම වර්ධනය කර ගත යුතු කියවීමේ රුචිය වැඩි දියුණු කිරීම සඳහා උනන්දු කරවීම ගෙදරටත්,පාසලටත්,රජය ඇතුළු විවිධ සංවිධානවලටත් පැවරෙන මහා වගකීමකි.

(ඊ) ශ්‍රී ලංකාව යනු සංවර්ධනය වෙමින් පවතින රටකි.මෙරට මූල ධනයෙන් වැඩි කොටසක් නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් වැය කරයි.පෙළපොත්,ඇඳුම්,පැළඳුම් නොමිලයේ ම ලැබෙන අතර සමහරුන්ට ශිෂ්‍යාධාර ද ලැබේ.අපේ පාසල්වලට අවශ්‍ය ලී බඩු,විද්‍යා උපකරණ,පුස්තකාල පොත්,ගොඩනැගිලි ආදිය මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවලින් ලැබේ.මේ සම්පත් උපයෝගී කරගෙන උගතුන්වන බොහෝ දෙනා අපේ මව්බිමට සේවය නොකර විදේශ රටවලට ගොස් තම දැනුම ඒ රටවලට බෙදා දෙති.එය රටේ සංවර්ධනයට මහත් බාධාවකි. (ල . 25)

(03) පහත දැක්වෙන ඡේද වචන **50 – 55** අතර වන සේ සාරංශ කොට ලියන්න.ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ලෝකයේ ඕනෑම භාෂා සාහිත්‍යයක විදග්ධ කවිය පහළ වීමට පෙර ජනකවිය සමාරම්භ වී තිබෙන බව පැහැදිලි ය.ඈත අතීතයේ සිටම අප රටේ ද ජනකවි සාහිත්‍යයක් තිබූ බව ඇල් ගෙවිලියක ගැයූ ගීයක් අසා සැටක් පමණ භික්ෂූන් වහන්සේලා රහත් වූ බව බුද්ධඝෝෂ හිමියන්ගේ සමන්ත පාසාදිකා අටුවාවේ සඳහන්ව තිබීමෙන් පැහැදිලි වෙයි.ජනකවි ලිඛිත සාහිත්‍යයක් වශයෙන් නොපැවතී අතර ඒවා ජනතාවගේ මතකය මත මුඛ පරම්පරාගතව පැවතී බව කිව යුතුය.කාලයෙන් කාලයට භාෂාව හා සාහිත්‍යය වෙනස් වන ආකාරයට ජනකවියද වෙනස් විය.දැනට මුද්‍රිතව පවත්නා ජනකවි එයට පෙරාතුව කෙසේ පැවතියේ ද යන්න නිගමනය කිරීම දුෂ්කර කරුණක් වී තිබේ. කෙසේ වුවත් ජනකවිය විවිධ ප්‍රදේශවල විවිධාකාරයෙන් පැවතීම ස්වාභාවිකය.කෙසේ වෙතත් ජනකවිය නිර්මාණය කළ කවීන් අපට කිසි දිනක දැකිය නොහැක.

කිසියම් වෘත්තියක් පදනම් කොට ගෙන ජනකවිය නිර්මාණය වීමද එහි විශේෂ ලක්ෂණයකි.ජනකවිය නිතරම තර්කයට,බුද්ධියට නොව හදවතට,ශක්තියට සමීප වූයේ ය.තම ජීවිතයේ හද ගැස්ම කවියට නගා ඔහු මිමිණුවේ ය. නිසඟයෙන් අනායාසයෙන් ඔහුගේ මුවින් පිටවුණු ඒ පදවැල් අතර ඔහුගේ දුක,සතුට,සෙනෙහස,කෝපය,හාස්‍යය උපහාසය,බලාපොරොත්තුව ආදී සියලුම හැඟීම් ගැබ්ව තිබිණි.ජනකවියා ජනකවි නිර්මාණය කළේ අනාගත පරපුරකට දැනගැනීම උදෙසා හෝ පදවැල් රචනා කිරීමෙන් තමාට ගෞරවයක් ලැබේ යැයි කියා හෝ නොවේ සිය චිත්තාභ්‍යන්තරයේ ජනිත ව කැකෑරෙන යම් හැඟීමක් නිසා යම් අපහසුතාවයකින් මිදී සැහැල්ලු වීම සඳහා ය.

(ල . 10)

(04) පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂාව මගින් අසන්නාගේ හෝ කියවන්නාගේ සිතෙහි රසයක් හා චමත්කාරයක් ඇති කරන නිර්මාණ සාහිත්‍ය යනුවෙන් හැඳින් වේ.ඒ අනුව චිරන්තන මෙන්ම නූතන ගද්‍ය,පද්‍ය,නවකතා,කෙටිකතා,නාට්‍ය ආදී නිර්මාණාත්මක කෘති සියල්ල සඳහා පොදුවේ සාහිත්‍ය යන නාමය යෙදේ.

සාහිත්‍ය පරාර්ථය උදෙසා කැපවූවකි.සාහිත්‍යකරුවා තම අදහස් තමා තුළ ම තබා නොගෙන අන්‍යයන් වෙත පමුණුවන්නේ එහෙයිනි.මේ කාර්යයෙහි ලා තිදෙනෙක් දායක වෙති. ඒ ලේඛකයා ,පාඨකයා හා විචාරකයා ය.ලේඛකයා තම මනසට එන අදහස් අපූර්වත්වයෙන් ලේඛන ගත කරයි.එම කාර්යයෙහි ලා ඔහු සතුව පවතින සියුම් බව හා පරිණත බව මත සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසේ.පාඨකයා සතු රුචිය හෝ පළපුරුද්ද අනුව කියවයි.විචාරකයා කෘතියේ අන්තර්ගතය ගැන විමසා බලයි.එහිදී ඊට අයත් විෂය ක්ෂේත්‍රය , භාෂාව , ශෛලිය හා ආකෘතිය වැනි ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙයි.

(1) ඡේදයට අනුව සාහිත්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(2) සාහිත්‍ය පරාර්ථය උදෙසා කැපවූවක් බව ලේඛකයා පවසන්නේ කුමක් නිසාද?

(3) සාහිත්‍යකරණය උදෙසා දායකත්වය සපයන පුද්ගලයෝ කවරහු ද?
(4) මෙම ඡේදයේ සඳහන් පරිදි සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසෙන්නේ ලේඛකයා සතු කවර ගුණාංග නිසාද?
(5) ලේඛකයා පවසන පරිදි කෘතියක් විචාරයට ලක්කිරීමේදී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු මොනවාද?

(05) පහත දැක්වෙන්නේ කිසියම් වෙළඳ දැන්වීමකින් උපුටාගත් කොටස් කීපයකි.

*අප්‍රේල් මාසය තුල 15% වට්ටම් සහිතව ලබාගත හැක.

* ඉංග්‍රීසි , සිංහල ,දෙමළ පාලි සංස්කෘත ආදී විවිධ පොත්

*සතියේ දිනවල උදේ 8.30 සිට සවස 5.30 දක්වා විවෘතයි.

*සෑම ඉරු දිනකම , පොහෝ දිනවල හා වෙළඳ නිවාඩු දිනකම වසා ඇත.

*පොත්වල මිල දර්ශනය ලබා ගන්න.

මේ තොරතුරු ඇසුරු කරගෙන යටිනුවර නගරයේ දෙවන හරස් වීදියෙහි "බුවනෙක" පොත්හල 2019 මාර්තු මාසයේ ප්‍රචාරක කටයුතු සඳහා පිළියෙළ කරන දැන්වීම වචන **100කින්** පමණ ලියන්න.

නැතහොත්

මොනර වැව " සෙත්පුර " විද්‍යාලයට වසර 100 ක් පිරිම නිමිත්තෙන් පාසල් පරිසර සංගමය පාසලේ රුක්රෝපණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තීරණය කරගෙන ඇත.ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලමින් මොනර වැව කෘෂි ව්‍යාපෘති නිලධාරිතුමාට යවන ලිපිය ලියන්න.අපේක්ෂිත ශාඛා වර්ග හා උපදෙස් ලිපියේ සඳහන් කරන්න.පාසල් පරිසර සංගමයේ ලේකම් ඔබ යයි සිතන්න

(වචන 100ක් පමණ සෑහේ.)

(ල . 15)